ET/SSS/2022(2023)/OL/62/S/A/S-4

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Civic Education

# පුරවැසි අධ්‍යාපනය



**Answer Sheet - I, II | පිළිතුරු පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa

The National e-learning Portal for The General Education

දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

## 1 පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 1 | 21. | 4 | 31. | 4 |
| 02. | 3 | 12. | 4 | 22. | 3 | 32. | 2 |
| 03. | 2 | 13. | 2 | 23. | 2 | 33. | 3 |
| 04. | 3 | 14. | 4 | 24. | 1 | 34. | 1 |
| 05. | 4 | 15. | 2 | 25. | 3 | 35. | 2 |
| 06. | 2 | 16. | 1 | 26. | 4 | 36. | 1 |
| 07. | 3 | 17. | 4 | 27. | 1 | 37. | 4 |
| 08. | 1 | 18. | 3 | 28. | 2 | 38. | 3 |
| 09. | 4 | 19. | 2 | 29. | 3 | 39. | 3 |
| 10. | 3 | 20. | 2 | 30. | 1 | 40. | 2 |

## පුරවැසි අධ්‍යාපනය - 11 (පිළිතුරු පත්‍රය)

01.

(I) ඇතැන්ස්, ස්පාටා

(II)

- ඒකීය රාජ්‍ය ව්‍යුහයක් තුළ පළාත් මට්ටමින් ජනතාවට බලය පැවරීම
- පළාත් මට්ටමින් විවිධ ජන කොටස්වල සංස්කෘතික හා භාෂාමය අනන්‍යතා තහවුරු කිරීම
- ඒ ඒ පළාත්වල සංවර්ධන හා පරිපාලනමය කටයුතු කඩිනම් කිරීම හා එමඟින් ජීවිතයේ දෛනික කටයුතුවල දී පැන නැගෙන ගැටලු විසඳීම වඩාත් පහසු කරවීම
- ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් කිරීම
- ප්‍රාදේශීය සම්පත් හඳුනා ගැනීම හා ඒවා කාර්යක්ෂම ව යොදා ගැනීම
- පාලන කටයුතු සඳහා පුළුල් ජනතා සහභාගිත්වයක් ඇති කිරීම
- ජනතාවගේ මූලික අවශ්‍යතා පහසුවෙන් ඉටු කරලීම
- ජනතාවට වඩාත් සමීප වූ පරිපාලන ඒකක පිහිටුවීම.
- ප්‍රාදේශීය නායකත්වය වර්ධනය කිරීම මඟින් ජාතික නායකත්වයට හා තරුණ නායකත්වයට අවස්ථාව ලබා දීම.
- මධ්‍යම ආණ්ඩුවේ කාර්යය ලිහිල් කිරීම. **(මින් ඕනෑ ම දෙකක්)**

(III)

- දූෂණයෙන්, වංචාවෙන් තොර රාජ්‍ය පාලනය හා පරිපාලනය
- නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම
- නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම
- අධිකරණයේ ස්වාධීනත්වය ආරාක්ෂා කිරීම
- රාජ්‍ය පාලන බලතල ක්‍රියාවට නංවන පුද්ගලයන් ජනතාවට වගකීමට බැඳී සිටීම
- අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම
- මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම
- සම්පත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් භාවිතයට ගැනීම
- විනිවිදභාවයකින් යුතු ව කටයුතු කිරීම
- ගුණාත්මක දේශපාලන සමාජානුයෝජනයට අවශ්‍ය පසුබිම සැකසීම
- ව්‍යවස්ථානුකූලවාදය ආරක්ෂා කිරීම **(මින් ඕනෑ ම දෙකක්)**

(IV)

- ප්‍රාග්ධන සූක්ෂ්ම
- ශ්‍රම සූක්ෂ්ම

(V)

- මූලික අයිතිවාසිකම් කඩ වීම් පිළිබඳ පෙත්සම් විභාග කිරීමේ බලය
- උපදේශන අධිකරණ බලය
- පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ අධිකරණ බලය
- රීති සැකසීමේ බලය
- අවසාන අභියාචනාධිකරණ බලය
- ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය
- ජනමත විචාරණ පෙත්සම් විභාග කිරීමේ බලය
- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය **(මින් ඕනෑ ම දෙකක්)**

(VI)

- යුරෝපා සංගමය (EU)
- උතුරු ඇමෙරිකානු නිදහස් වෙළඳ ගිවිසුම (NAFTA)
- දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම (SAPTA)
- බහු ආංශික, තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (BIMSTEC) **(මින් ඕනෑ ම දෙකක්)**

(VII)

- හොඳින් සවන් දීම
- පක්ෂග්‍රාහී නොවීම
- මධ්‍යස්ථ වීම
- නිවැරදි තීරණ ගැනීම
- විචාරශීලී බව
- නිර්මාණශීලී බව
- යමක් පැහැදිලි කිරීමේ හැකියාව
- සාධාරණභාවය **(මින් ඕනෑ ම දෙකක්)**

(VIII)

- මරණ දඬුවම නියමවූවකුගේ එම දඬුවම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශය ජනාධිපතිවරයාට ලබා දීම
- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත්වලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබා දීම
- ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පවත්වනු ලබන නඩුවල දී පාර්ශ්වකරුවකු ලෙස සහභාගි වීම
- රජය සම්බන්ධ නඩුවල දී නීති උපදෙස් ලබා දීම
- නඩුවලට රජය වෙනුවෙන් පෙනී සිටීම

**(මින් ඕනෑ ම දෙකක්)**

(IX)

- පරිසර අමාත්‍යාංශය
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- සමුද්‍ර පරිසර ආරක්ෂක අධිකාරිය
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව **(මින් ඕනෑ ම දෙකක්)**

(X)

- ලෝක බැංකුව
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

02.

(I)

- ආණ්ඩුවේ ප්‍රධාන ආයතන වන ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය නිර්මාණය වන ආකාරය
- එම ආයතනවල බලතල, කාර්යභාරය හා එම ආයතන අතර පවත්නා සබඳතාවල ස්වරූපය
- ආණ්ඩුව හා පුරවැසියා අතර පැවතිය යුතු සම්බන්ධතාවයන්හි ස්වරූපය
- පුරවැසියන් සතු මූලික අයිතිවාසිකම්
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ආකාරය **(මින් කරුණු දෙකක්)**

(II)

- පාලනය ක්‍රමවත් වීම
- ස්ථාවර බව
- පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ පාලක පාලිත දෙපක්ෂය ම දැනුවත් වීම
- පාලක අත්තනෝමතිකභාවය වළක්වා ගත හැකි වීම
- අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම
- මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම
- රටවැසියන්ට සිය අවශ්‍යතා, සිතුම්-පැතුම් ඉටු කර ගත හැකි වීම
- නීතිමය රැකවරණය සැමට සමාන ව ලැබීම **(මින් කරුණු තුනක්)**

(III) (a)

- සර්වජන ඡන්ද බලය පදනම් කර ගෙන ආණ්ඩු සහ පාලකයින් තෝරා ගැනීම
- තරගකාරී පක්ෂ ක්‍රමය
- ඡන්ද කොට්ඨාස ක්‍රමය
- නිදහස් හා සාධාරණ මැතිවරණ
- ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් පැවතීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ව කටයුතු කිරීම **(මින් කරුණු තුනක්)**

(b) ඉහත එක් කරුණක් කෙටියෙන් විස්තර කළ යුතු ය.

03.

(I)

- සෑම කෙනෙකු ම රටේ නීතියට යටත් වීම
- ස්වාධීන අධිකරණයක් මඟින් සෑම දෙනාට ම සර්ව සාධාරණව හා සමාන ව නීතිය ක්‍රියාත්මක කිරීම
- අපක්ෂපාතී, නිශ්චිත, සාධාරණ හා යුක්ති සහගත පොදු නීති පද්ධතියක් තිබීම

**(මින් ඕනෑ ම කරුණු දෙකක්)**

(II)

- විනිශ්චයකාරවරුන් පත් කිරීම
- විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම
- විනිශ්චයකාරවරුන්ගේ වැටුප්
- වෙනත් තනතුරු පිළිගැනීම
- අනවශ්‍ය මැදිහත්වීම් හා පාලනය කිරීම් සීමා කිරීම
- අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

**(මින් ඕනෑ ම කරුණු තුනක්)**

(III) (a)

- පුද්ගලයන් තුළ අධිකරණ පද්ධතිය හා නීතිය පිළිබඳ විශ්වාසයක් නොමැති වීම
- නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒම
- රට තුළ සිදු වන අපරාධ හා දූෂණ වර්ධනය වීම
- රට තුළ නීතියේ සාමානාත්මතාව හා සාධාරණත්වය පිරිහීම
- යුක්තිය ඉටු කර ගැනීම සඳහා අනියම් ක්‍රම භාවිතයට පෙළඹීම
- යුක්තිය ඉටු කර ගැනීමට විශාල කාලයක් හා ශ්‍රමයක්, මුදලක් වැය කිරීමට සිදු වීම
- මිනිසුන් තුළ අධිකරණයට හා නීතියට ඇති ගෞරවය හීන වීම

**(මින් ඕනෑ ම කරුණු තුනක්)**

(b) ඉහත එක් කරුණක් කෙටියෙන් විස්තර කළ යුතු ය.

04.

(I)

- ශ්‍රී ලංකාව
- මහා බ්‍රිතාන්‍යය
- ප්‍රංශය **(වැනි ඕනෑම රටවල් දෙකක්)**

(II)

- නීති පැනවීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය උත්තරීතර වීම
- පරිපාලනය පහසුකර ගැනීම සඳහා බලය විමධ්‍යගත කර තිබීම
- ත්‍රිවිධ බලතල මධ්‍යම ආණ්ඩුව වෙත ඒකරාශී වී තිබීම **(මෙවැනි කරුණු තුනක්)**

(III) (a)

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා පමණක් ප්‍රාන්ත ආණ්ඩුවල කැමැත්ත ලබා ගත්ත ද සාමාන්‍ය නීති සම්පාදන කාර්යයන්හි දී ප්‍රාන්තවල කැමැත්ත නොසලකා හැරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කරන අවස්ථාවල දී මධ්‍යම ආණ්ඩුවට වාසි සහගත ලෙස එය සිදු කිරීම
- මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර මූල්‍ය ගණුදෙනු පවත්වා ගෙන යෑමේ දී වඩා ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව වීම
- රාජ්‍යය විසින් සපයන සුබසාධන කාර්යය ඉහළ යෑම තුළින් එහි වගකීම මධ්‍යම ආණ්ඩුවට පැවරීම
- සන්නිවේදන හා ප්‍රවාහන සේවා තුළ සිදු වී ඇති අතිනවීන දියුණුව නිසා සම්බන්ධීකරණය වේගවත් වීම
- ලෝක ආර්ථික අර්බුද හමුවේ මුළු රටට ම බලපාන ආර්ථික තීන්දු ගැනීමේ වගකීම මධ්‍යම ආණ්ඩුවට පැවරීම

**(මින් ඕනෑ ම කරුණු තුනක්)**

(b) ඉහත එක් කරුණක් විස්තර කරන්න.

05.

(I)

- තරගකාරී වෙළඳපොළක් පැවතීම
- නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතු වීම
- ලාභය අරමුණු කර ගෙන නිෂ්පාදනය සිදු වීම
- ආදායම් අසමාන ලෙස බෙදී යෑම **(මින් ලක්ෂණ දෙකක්)**

(II)

- කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
- කෙසේ කවුරුන් නිෂ්පාදනය කරන්නේ ද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

(III) (a)

- රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම
- වෙළඳපොළ තත්ත්ව මත මිල තීරණය වීමට ඉඩ සැලසීම
- දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයන් දිරි ගැන්වීම
- සහනාධාර හා මිල පාලන ක්‍රම ලිහිල් කිරීම **(මින් කරුණු තුනක්)**

(b) ඉහත එක් කරුණක් කෙටියෙන් විස්තර කළ යුතු ය.

06.

(I)

- ළමා ශ්‍රමිකයන් ලෙස ළමයින් සේවයෙහි යොදවා ගැනීම
- ළමයින් විවිධාකාර අපයෝජනවලට ලක් වීම
- විවිධ ත්‍රස්තවාදී කණ්ඩායම් ළමයින් සොල්දාදුවන් ලෙස යුධ කටයුතු සඳහා යොදවා ගැනීම
- පැහැර ගෙන යෑම
- පාසල් නොයැවීම
- වධ හිංසාවලට ලක් වීම **(මින් ඕනෑ ම කරුණු දෙකක්)**

(II)

- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම
- සෑම අවස්ථාවක දී ම ළමයාගේ උපරිම යහපත සැලසෙන පරිදි කටයුතු කිරීම
- ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කරන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවීම
- පරිවාස හා ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වා ගෙන යාම හා බලය පැවරීම
- ළමා හා කාන්තා කාර්යාංශය පිහිටුවීම
- ශ්‍රී ලංකාවේ ළමා දුරකථන සේවය පිහිටුවීම (1929) **( මින් ඕනෑ ම කරුණු ත්නක්)**

(III) (a)

- ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කිරීම
- මානව හිමිකම් කොමිසම වෙත පැමිණිලි කිරීම
- ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැමිණිලි කිරීම

(b) ඉහත එක් කරුණක් කෙටියෙන් විස්තර කළ යුතු ය.

07.

(I)

රාජ්‍ය උපාය සම්බන්ධතා
යුද උපාය සම්බන්ධතා

(II)

- සම්පත් විසංතුලනය
- අවශ්‍යතා සියල්ල ම තම රට තුළ නිපදවා ගත නොහැකි වීම
- අතිරික්ත නිෂ්පාදන අලෙවි කර ගැනීම
- ප්‍රවාහන හා සන්නිවේදනයේ දියුණුව
- දියුණු තාක්ෂණය ලබා ගැනීමේ අවශ්‍යතාව
- හදිසි ආපදා හා වෙනත් විශේෂ අවස්ථාවල දී සහය ලබා ගැනීමට
- දේශපාලන, ආර්ථික, සමාජීය, සංස්කෘතික සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීම

(III) (a)

ඇමෙරිකානු ඩොලර්, ස්ටර්ලින් පවුම්, යුරෝ, ජපන් යෙන්

(b)

- යුරෝපා පොදු වෙළඳ හවුල
- උන්ක්ටාඩ් සංවිධානය
- ගැට් සංවිධානය
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

*****